# **රාවනා ගල හා ලක්ෂපාන දිය ඇල්ල - මස්කෙළිය**

මෙම සංචාරයේ අරමුණ: රාවනා ගල පිලිබඳ සොයා බැලීම, ලක්ෂපාන ඇල්ල නැරඹීම

දිනය : 2016 ජුලි 09 දින

සහභාගී වුවන් ගණන: 3 (නිශාන් කුළසිංහ, අරුණ සුගතපාල, මුදිත රුබසිංහ)

ගමන් කල ආකාරය: පොදු ප්‍රවාහන බස් රථ හා ලොරි ආදියෙන්

විශේෂ ස්තුතිය: මුදිත රුබසිංහ

මෙම වාර්තාව සැකසුයේ: නිශාන් කුළසිංහ විසිනි

**කොළඹ සිට රාවනා ගල හා ලක්ෂපාන දිය ඇල්ල දක්වා අප ගමන් ගත් මාර්ගය**

**මහරගම --> අවිස්සාවේල්ල --> ගිනිගත්හේන --> දියගල හන්දිය (දකුණට) --> නොර්ටන් බ්‍රිජ් --> ඩබල් කට් හන්දිය --> මස්කෙළිය පාර --> ලකම්බේ බසාර් බස් නැවතුම --> රාවනා ගල --> ආපසු පැමිණීම පෙර මාර්ගය ඔස්සේ --> 4 කනුව හන්දිය (වමට) --> කොත්තැල්ලෙන ගම්මානය --> ලක්ෂපාන ඇල්ල**

**පරිසරය පිළිබඳව**

මෙම ප්‍රදේශය කඳුකර, ශීත දේශගුණය සහිත තේ වතු වලින් හැඩ වූ ප්‍රදේශයකි. මීදුමෙන් වැසී යන තද සුළං සහිතයි. කුඩැල්ලන් බහුලව දක්නට ඇති නිසා පැඟිරි තෙල් වැනි කුඩැලි විකර්ශකයක් භාවිතා කරන්න. සර්පයින්, දිවියා, වල් ඌරා, මී මැස්සා ආදී අනතුරුදායක සතුන් ගැවසිය හැක. අධිපාර හා පොලොවේ ඇතැම් ස්ථාන ලිස්සන හා එරෙන සුළුය. රාවනා ගල කිට්ටුවටම වාහනයකින් යාමටද හැකියාවක් පවතී. ඒ සඳහා රළු භාවිතයට ඔරොත්තු දෙන වාහන පමණක් භවිතා කල යුතුය. කෙසේ වෙතත් අප ඔබට යෝජනා කරන්නේ පයින්යාම වඩා උචිත බවය. ප්ලාස්ටික්, පොලිතින් ආදිය එහි ගෙන නොයන්න. ගල් වල ගස්වල විවිධ දෑ ඇඳීමෙන් වලකින්න. මෙම අලංකාර පරිසර පද්ධතිය ආරක්ෂා කරගන්න.

www.lakviskam.org

**ගමන පිළිබඳව**

පසුගිය පෙබරවාරි මාසයේදී අප සිදුකල මස්කෙළිය සප්තකන්‍යා කඳු වැටි තරණයේදී එම ප්‍රදේශයට ආසන්නයෙන් වූ රාවනා ගල නම් ස්ථානයක් ගැන දැනගන්නට ලැබුණි. කඳු වැටියට ආසන්නයෙන් වූ ලක්ෂපාන දිය ඇල්ල හා රාවන ගල නැරඹීමට ඇති වූ දැඩි උවමනාව පදනම් කරගෙන මාස කිහිපයකට පසු නැවතත් මස්කෙළිය බලා පිටත් වුනෙමු. මුදිත හා අරුණ මෙවර ගමනට එක් විය. පාන්දර 4 ට මහරගමින් බදුල්ල බසයක නැගී අවිස්සාවේල්ල බලා ගොස් පෙ.ව 5ට අවිස්සාවේල්ලෙන් මස්කෙළිය බලා යන ලංගම බසයේ නැගී ගමන ආරම්භ කළෙමු. කිරිවන්එළියේදී මුදිතගේ නෑදෑ කෙනෙකු විසින් දහවල් කෑම පාර්සල් බස් රථයට ලබා දෙන ලදී. සප්තකන්‍යා කඳු වැටිය පාමුලින් දිවෙන ඉතාමත් අලංකාර මස්කෙළිය පටු මාර්ගය ඔස්සේ ගමන් කර උදෑසන 8.45 වනවිට 'ලකම්බේ බසාර්' නම් බස් නැවතුමෙන් බැස ගත්තෙමු. මාස කිහිපයක් පුරා එම ප්‍රදේශයට බලපා තිබූ වියලි කාලගුණය නිමා කර ඊට පෙර දින රාත්‍රියේ සිට වර්ෂාව ආරම්භ වී තිබුණි. එය අපේ ගමනට බාධා ගෙන දුන් හේතුවක් විය. බස් නැවතුමේ සිට වම් පසට විහිදෙන මවුස්සාකැලේ තේ වත්තේ 'නයන්සා උඩ කොටස' දෙසට ගමන් ආරම්භ කළෙමු. වර්ෂාවක් අත ළගම එන නිසා අසල තිබූ කුඩා වතු නිවසකින් කුඩයක් ණයට ඉල්ලා ගත්තේ අප කැමරා ආදී උපකරණ වල ආරක්ෂාවටයි.




බස් නැවතුමේ සිට යා යුතු දිශාව



තේ වතු අතරින් ඉහලට

නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි මෙම රාවනාගලට ගමන් කිරීමට තේවත්ත ඔස්සේ ඇති මාර්ගය දිගේ ගමන් කල යුතුය. පා ගමනින් ගිය  අප තේ වත්ත මැදින් ඇති ජලය පහලට ගලා එන කානු ඔස්සේ ඉහලට නැගීම ආරම්භ කළෙමු. මෙසේ ගමන් කිරීම අපහසු දායක වුවත් ඒ මගින් විශාල ලෙස ගමන් මාර්ගය කෙටි කර ගත හැකි විය. අතරමගදී වූ තේ දළු කිරණ මඩුවක් ආසන්නයේදී වර්ෂාව ආරම්භ විය. වැස්ස අඩු වන තෙක් මඩුවේ විනාඩි 15ක් පමණ ගත කල අප ගෙන ආ ආහාර වර්ග අනුභව කළෙමු. වර්ෂාව අඩු වූ පසු  නැවත කන්ද නැගීම ආරම්භ කළෙමු. අපව ගසාගෙන යාමට තරම් ප්‍රබල දැඩි සුළගක් පැවති අතර එහි ශබ්ධය මිග් ජෙට් යානාවක ශබ්ධය මෙන් ඉතා ගෝෂාකාරී විය. අතරමගදී ලයින් කාමර නිවාස හමු වුවත් ඒවායේ පාළු බවක් පෙනිණි. අතරමගදී වතු කම්කරුවෙක් අපට යා යුතු මාර්ගය කියා දුනි. ඒ ඔස්සේ ඉදිරියට ගිය අපට ගල් ලෙනක් තුල තිබූ කෝවිලක් හමු විය. එයට වන්දනාමාන කර අවට බැලූ අපට සප්තකන්‍යා ඇතුළු ඈත කඳු මුදුන් සම්පූර්ණයෙන්ම මීදුමෙන් වැසී ගොස් ඇති ආකාරය පෙනින. ගමනේ අතරමගදී අපගේ වෙහෙස හා බඩගින්න නිවා ගැනීමට එල බරවූ රසවත් ඇඹුල් පේර, දොඩම් වැනි පලතුරු ගස් හමු විය.

www.LakViskam.org



කෝවිල



ඇඹුල් පෙර

දැඩි සුළගට මුහුණදෙමින් ඉදිරියට යන විට ඈතින් මස්කෙළිය ජලාශය හා ගාර්ට්මෝර් දියඇල්ල ඉතාමත්ම අලංකාර පෙනෙන ස්ථානයක් හමු වේ. එම දර්ශණතලයේ නෙත් සිත් ඇදගන්නා සුළු බව වචනයෙන් විස්තර කර නොහැක. (මෙම දිය ඇල්ලට මෙපිටින් ඇති මරේ වතු යායේ මරේ ඇල්ල දර්ශණය වන පීක් ෆීල්ඩ් වත්තේ ශ්‍රී පාද කන්දට කිට්ටුවෙන් ඉදි කිරීමට යන හෝටලයක් පිළිබඳව මේ දින වල සමාජයේ දැඩි කතා බහක්ද පවතී). වැස්ස විටින් විට අපේ ගමනට බාධා කලේය. එම නිසා ජායාරූප ගැනීමද සීමා විය.



දොඩම්



මස්කෙළිය ජලාශය හා ඈතින් පෙනෙන ගාර්ට්මෝර් දිය ඇල්ල

කෙසේ හෝ සීතලේ ගැහෙමින් ගිය අපට ඈතින් රාවනා ගල කළුගල් තලාව දිස් වන්නට විය. කෙනෙකු මවිත කරවීමට සමත් එම ස්ථානයට ලං වූ අපට දක්නට හැකි වුයේ ඉතා විශාල පැතිලි කළු ගල් තලාවක් හා එහි වූ අපූර්ව පිහිටීමයි. එය ස්වභාවිකව නිර්මාණය වුවක්ද යන්න පවා සැක පහල කරවන සුළු පිහිටීමකි. ගල් තලාවේ මුහුණත ප්‍රදේශය එළිමහන් උස් පෙදෙසකි. එම මුහුණත ප්‍රදේශයට ඉතා ඈතින් කඳු වැටි, ජලාශ වල චමත්කාරය කදිමට දර්ශණය වේ. මීදුමෙන් හැඩ වැඩ වී ඇති කඳු සහ අවට දර්ශණය නියම සුරපුරයක සිරි ගන්වයි. ගල්තලාවේ මුහුණත පිහිටි දෙසට සාමාන්තරව විහිදෙන කුඩා කානු වැනි රේඛා දක්නට ලැබේ. මෙම රේඛා හොඳින් නිරීක්ෂණය කිරීමේදී මෙය යමෙකු නිර්මාණය කල දෙයක්විය හැකියැයි සාධාරණ සැකයක්ද පහල වේ. ඇතැම් විට අතීතයේදී මෙම ස්ථානයෙන් විශාල ගල් පතුරු කපා ඉවත් කර ඇතිවාවිය හැක. මෙම ගල් තලාව මතට කුඩා ගුවන්යානයක් හෝ හෙලිකොප්ටර් යානයක් ගොඩ බැස්ස වීමට හෝ ගුවන් ගත කිරීමට හැකියාවක් පවතී.

www.LakViskam.org



මීදුම්වලා අතරින් රාවනා ගල මත ඇවිදිමින්



සමාන්තර රේඛා

පස් වලින් වැසී පවතින කොටසේ ඇත්තේද මෙම ගල් තලාවයි. ඒ මත විශාල ගස් දක්නට නොමැති වීමෙන් ඒ බව තහවුරු වේ. වතු කම්කරුවන් පැවසුයේ ගල් තලාව පිටට පෙනෙනවාට වඩා ඉතාමත් විශාල ප්‍රදේශයක් ආවරණය වන සේ පැතිර ඇති බවයි. එසේම එහි කුඩා පොකුණක් දක්නට ලැබේ. අතීතයේදී එය විශාලව පැවතියත් අද කුඩාවට දක්නට ඇතැයි වතු කම්කරුවන් පැවසූහ.



ඈතට පෙනෙන ගල් තලාව



කොත්තැල්ලෙන ලක්ෂපාන දිය ඇල්ල

රාවනා ගල ලෙස මෙම ස්ථානය හැඳින්වීමට හේතුව රාවනා රජුගේ තවත් ගුවන්යානා තොටුපොළක් ලෙස භාවිතා වීම නිසා යැයි මතයක් ජනශ්‍රැතියේ එයි. දඬුමොනරය නිතර ගමන් ගත් නුවරඑළිය ප්‍රදේශයේ පිහිටි මෙම ස්ථානය දඬුමොනරය වැනි අහසින් යා හැකි යානා ගොඩබෑම හා ගුවන්ගත කිරීමට ඉතාමත් සුදුසු ස්ථානයකි. ගල් තලාවේ ඇති සමාන්තර රේඛා දෙක යානා වල රෝද ගමන් කිරීමට සකස් කර තිබූ ඒවා බවට මතයක් පවතී. එම රේඛා අගලක් පමණ පළලින් යුතුය. රේඛා සමහර තැන්වල මැකී යමින් පවතී. ශ්‍රී පාද (සමනල) කන්ද හා බෑන සමනල කඳු වලට කිට්ටුවෙන් මෙම ස්ථානය පිහිටා තිබීමද තවත් විශේෂත්වයකි. ගල්තලාව මත හා අවට ප්‍රදේශයේ අසිරිය මැනවින් විඳ ගත් අප තිදෙනා නැවත කන්ද බැසීම ආරම්භ කළෙමු. අපට මග පෙන්වූ කම්කරුවා හමු වූ අපි ඔහුට සන්තෝෂමක් ලබාදී තද සුළං, වර්ෂාව මධ්‍යයේ පහලට ආවෙමු. ණයට ඉල්ලාගත් කුඩයද ආපසු ලබා දී සුළු මුදලක් ඔවුන්ටද ලබා දී ලකම්බේ බසාර් බස් නැවතුමේ රැඳී සිටියෙමු. කූඩැල්ලන් අප හට සැලකිය යුතු හානියක් සිදු කර තිබුණි. බොහෝ වෙලාවක් බලා සිටියත් බස් රථය එන බවක් නොපෙනුනෙන් පයින්ම මස්කෙළිය මාර්ගයේ නොර්ටන් බ්‍රිජ් දෙසට ගමන් ආරම්භ කළෙමු. කිලෝමීටර් එකහමාරක් පමණ ගිය පසු කුඩා එල්ෆ් ට්‍රක් රථයක් නතර කරවාගෙන 4 කණුව හන්දිය දක්වා යාමට හැකි දැයි විමසුවෙමු, ඔවුන් ඊට කැමති වුයෙන් ට්‍රක් රථයේ නැගී හතරේ කනුව දක්වා ගොස් එතැන් සිට කොත්තැල්ලෙන ගම්මානය දෙසට පයින් ගමන් කලෙමු. සාමාන්‍ය වංගු සහිත මාර්ගය මග හැර තේවතු මැදින් පහලට බැසීම සිදු කළෙමු. සප්ත කන්‍යා සංචාරයේදී හොල්මන් ඇතැයි සඳහන් කල අතහැර දැමූ තේ කර්මාන්ත ශාලාව අසලින් වූ පාලමද පසු කල පසු කුඩා ඩිමෝ බට්ටා ලොරියක් පැමිණි අතර එහි නැගී කොත්තැල්ලෙන ගම්මානයට පැමිණියෙමු. සප්ත කන්‍යා කඳු පාමුල පිහිටි ගම්මානයේ සිටි අපට මීට මාස කිහිපයකට පෙර දුටු අති දැවැන්ත කඳු පංතිය දැක ගැනීමට නොතිබුණි. එය සම්පූර්ණයෙන්ම ඝන මීදුමෙන් වැසි තිබුණි. කොත්තැල්ලෙන කඩමණ්ඩිය අතරින් පහලට සැලකිය යුතු දුරක් ගමන් කර පසු ලක්ෂපාන දිය ඇල්ල හමු වේ. වැස්ස නතර වී තිබුනත් පැය කිහිපයකට පෙර ඇති වූ වර්ෂාවෙන් දිය ඇල්ල පණ ගසා ඉතාමත්ම අලංකාර ස්වරූපයක් ආරූඪ කරගෙන තිබිණි. කිසිදු අයෙකු එහි නොවූයෙන් හිතේ හැටියට කාලය ගත කර නා ගත් අප දිවා ආහාරයද ගෙන ආපසු ආ මග ඔස්සේම කොළඹ බලා පිටත් වූයෙමු.

**අතිරේක යොමු**

අප සංචාරයේ තවත් ඡායාරූප එකතුවක් පහත යොමුවෙන් නරඹන්න.

https://goo.gl/photos/W9RaP3wRZFtGovL86

---

මෙම වාර්තාවේ අයිතිය "ලක් විස්කම්"වෙබ් අඩවිය සතුය. ©www.lakviskam.org (2016 ඔක්තෝම්බර් 30)
විමසීම්සහ අදහස් : lakviskam@gmail.com
www.Lakviskam.org